ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

**පුවත්පත් නිවේදනය**

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2012.07.21 |

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම යටතේ නමවන සහ අවසාන වාරිකය වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 415 ක් ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබුණි**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) විසින් සමීපස්ථ ණය පහසුකමට අදාළ අටවන සහ අවසාන විමර්ශනය සාර්ථකව නිම කරමින් 2012 ජූලි 20 වැනි දින වි.ගැ.හි. මිලියන 275.6 (දළ වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 415) ක වටිනාකමින් යුත් නමවන වාරිකය ශ්‍රී ලංකා මහ බැංකුවට මුදාහරින ලදී. මෙම නමවන වාරිකය මුදාහැරීමත් සමඟ, 2009 ජූලි මාසයේ දී සමීපස්ථ ණය පහසුකම යටතේ අනුමත වූ මුළු ණය ප්‍රමාණය වන වි.ගැ.හි මිලියන 1,654 (දළ වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 2,548) ශ්‍රී ලංකාව වෙත ලැබී ඇත. මෙම සමීපස්ථ ණය පහසුකම සාර්ථකව නිම කිරීම තුළින් ශ්‍රී ලංකාව ජා.මූ.අ. සමඟ පැවති දීර්ඝතම සබැඳියාව පිළිබිඹු වන අතර, එම ණය පහසුකම බහු පාර්ශ්වීය ආයතනයකින් මෙතෙක් ලබා ගත් විශාලතම තනි ණය පහසුකම වේ.

මෙම පහසුකමෙහි ප්‍රධාන අරමුණු වූයේ විදේශ සංචිත නැවත ගොඩනංවා ගැනීම, රාජ්‍ය මූල්‍ය තත්ත්වය සවිමත් කිරීම, මූල්‍ය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම සහ දේශීය මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමත්ය. ආනයනික මාස 3.5 කට සමාන වන පරිදි විදේශ සංචිත

හිතකර මට්ටමකට ගොඩනංවා ගැනීම, අයවැය හිඟය පාලනය කිරීම, උද්ධමනය තනි අංකයක මට්ටමේ පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පවත්වා ගැනීම තුළින් සමීපස්ථ ණය පහසුකම් වැඩසටහන යටතේ වූ මෙම සියලුම අරමුණු ශ්‍රී ලංකාව විසින් සාර්ථකව මුදුන්පත් කර ගන්නා ලදී. මේ හා සම්බන්ධව, 2009 වසරේ සිට ශ්‍රී ලංකා ආර්ථිකය අත්පත් කර ගත් ප්‍රගතිය සඳහා සමීපස්ථ ණය පහසුකම හරහා ජා.මූ.අරමුදල ලබාදුන් දායකත්වය ශ්‍රී ලංකා බලධාරීන් විසින් අගය කරනු ලබයි.

ශ්‍රී ලංකා බලධාරීන් විසින් ජා.මූ.අරමුදල සමඟ තවදුරටත් සමීපව කටයුතු කිරීමට බලාපොරොත්තු වන අතර, විස්තීර්ණ ණය පහසුකම (EFF) යටතේ ආර්ථික සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය සහාය ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සාකච්ඡා කිරීමට ද අපේක්ෂා කෙරේ.

2012 ජූලි මස 20 වැනි දින ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කළ අභිප්‍රාය පළ කිරීමේ ලිපිය (LOI) සහ තාක්ෂණික අවබෝධතා ගිවිසුම (TMU) ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ (www.cbsl.gov.lk ) පළකර ඇත.

**ශ්‍රී ලංකාව - අභිප්‍රාය පළ කිරීමේ ලිපිය**

2012 ජූලි 05 වැනි දින

ක්‍රිස්ටීන් ලගාඩේ මහත්මිය
කළමනාකරණ අධ්‍යක්ෂ
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
වොෂින්ටන්, DC 20431

හිතවත් ලගාඩේ මහත්මියනි,

මෙම ලිපිය, 2009 ජූලි මස 16 වන දින දරන ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති සංදේශය සහ 2009 ඔක්තෝබර් මස 30, 2010 ජූනි මස 19, 2010 සැප්තැම්බර් මස 14, 2011 ජනවාරි මස 17, 2011 මාර්තු මස 15 සහ 2012 මාර්තු මස 15 යන දිනයන් දරන අභිප්‍රාය පළ කිරීමේ ලිපිවලට අතිරේකවයි.

1. 2009 වසරේ දී ගැටුම්කාරී වාතාවරණය නිමා වීමෙන් පසුව සිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් සමීපස්ථ ණය පහසුකමේ සහය ඇතිව ශ්‍රී ලංකා ආර්ථිකය අභියෝග කළ නොහැකි සාර්ථකත්වයක් වාර්තා කර ඇත. 2010 සහ 2011 වසරවල සාමාන්‍ය ආර්ථික වර්ධනය සියයට 8 කට වඩා වැඩි මට්ටමක පැවතුණි. තවද උද්ධමනය තනි අගයකට පහතට ගෙන ඒමට හැකි වූ අතර එම තනි අගය නූතන ආර්ථික ඉතිහාසයේ දීර්ඝතම කාලයක් පවත්වා ගැනීමට හැකි විය. එසේම, අයවැය හිඟය ක්‍රමයෙන් අඩුවීම ද.දේ.නි.යේ අනුපාතයක් ලෙස ණය අඩුවීමට උපකාරී වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව සතුව ඇති ජාත්‍යන්තර සංචිත ක්‍රමානුකූලව ගොඩනගා ගැනීමට හැකිවී ඇත.

2. ආර්ථිකයේ වර්ධනය සමග, ආනයන ද වර්ධනය වූ අතර, ණය අධික ලෙස වර්ධනය වීම සහ තෙල් මිල ගණන් ඉහළ යාම ද මෙම ආනයන වර්ධනයට හේතු විය. එබැවින්, අපනයන හා විදේශ ප්‍රේෂණවල සිදු වූ ශක්තිමත් වර්ධනය හමුවේ වුවද, සංචිත මත පීඩනයක් ඇති කරමින් පසුගිය වසර තුළ දී ජංගම ගිණුමේ හිඟය තියුණු ලෙස පුළුල් විය. මෙම හිඟය පියවීමට විදේශ ප්‍රාග්ධන ලැබීම් එක්රැස් කිරීම සඳහා වූ අපගේ ප්‍රයත්නයන් තව දුරටත් ක්‍රියාත්මක කරන ලද අතර, පෙබරවාරි මාසයේ දී අප විසින් ක්‍රියාවට නංවන ලද පැහැදිලි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් සමූහය තුළින් ජංගම ගිණුමේ හිඟය පාලනය කිරීමට හා එමගින් මූල්‍යන අවශ්‍යතාවය අඩුකිරීමට හැකි විය. (i) විදේශ විනිමය වෙළෙඳපොළ වෙත මැදිහත් වීම අවම කිරීම තුළින් විනිමය අනුපාතය සඳහා පුළුල් නම්‍යතාවයක් ලබාදීම; (ii) ප්‍රතිපත්තිමය පොලී අනුපාත ඉහළ දැමීම සහ බැංකු ණය වර්ධනය පාලනය කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම; (iii) තීරු බදු වැඩිකිරීම සහ රාජ්‍ය ව්‍යවසායන්ගේ අලාභ අවම කිරීම සඳහා ද උපකාරී වන ලෙස ජාත්‍යන්තර මිල ගණන් පිළිබිඹු වන ආකාරයෙන් බලශක්ති මිල ගණන් ගැලපීම තුළින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය තවදුරටත් වර්ධනය කිරීම; සහ (iv) මෙම සියලුම ප්‍රතිපත්තිමය උපකරණ වෙනස්වන ආර්ථික තත්ත්වයනට සරිලන පරිදි නම්‍යශීලී ලෙස යොදාගැනීමට ඇති පොදු එකඟතාවය යනාදිය මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ඇතුළත් විය.

3. දැනට ගතවූයේ මාස කිහිපයක් පමණක් වුවද, මෙම ප්‍රතිපත්ති සමූහය මේ වන විටත් වඩාත් පැහැදිලි ප්‍රතිඵල පෙන්වා ඇත. ණය වර්ධනය මන්දගාමී වී, ආනයන වර්ධනය සෘණාත්මක තත්ත්වයකට පරිවර්තනය වී ඇති අතර ජංගම ගිණුමේ හිඟය අඩු වී ඇත. එසේම, වාණිජ බැංකු විසින් විදේශ ප්‍රාග්ධනය සැලකිය යුතු ප්‍රමාණයකින් රැස්කර ගෙන ඇති අතර නුදුරු අනාගතයේ දී තවත් ස්වෛරීත්ව යුරෝ බැඳුම්කරයක් නිකුත් කිරීමට ඇති ශක්තිමත් හැකියාව මෙමගින් පිළිබිඹු වේ. මේ අතර, කොටස් වෙළෙඳපොළ වෙත සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් ලැබී ඇත. නැවත වරක් සංචිත මට්ටම වර්ධනය කිරීමට උපකාරී වෙමින් 2012 වසර තුළ දී ගෙවුම් තුලනයෙහි අතිරික්තයක් වාර්තා වේ යැයි අපේක්ෂා කෙරේ. තවදුරටත්, ගනු ලැබූ මෙම ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග තුළින් අපගේ ආර්ථික මූලධර්මයන් ශක්තිමත් වී කම්පනයන්ට මුහුණ දීමට ඇති හැකියාව වර්ධනය කර ඇති අතර, එළඹෙන වර්ෂයන් තුළ ද ආර්ථික ක්‍රියාකාරිත්වය ශක්තිමත්ව හා අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පදනම

සකසා ඇත. නුදුරු කාලයේ දී උද්ධමනය වර්ධනය විය හැකි අතර ආර්ථික වර්ධනය මන්දගාමී විය හැකිය. කෙසේ නමුත්, ගනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් ඉදිරියට පැවතිය හැකි උද්ධමන පීඩනය අවම විය හැකි අතර ගෝලීය වශයෙන් ඇති විය හැකි අවදානම් සහ ඒ තුළින් ආර්ථිකය මත ඇති කළ හැකි බලපෑම් මැඩ පැවැත්වීමට උපකාරී වේ. මේ අනුව බලන කල, අප විසින් නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් දිගටම පවත්වාගෙන යනු ලබන අතර, මේ තුළින් බාහිර කම්පනයන්ට ඔරොත්තුදීමේ හැකියාව ඇති කරනු ඇත.

4. ආර්ථික වර්ධනය සහ ආනයන වර්ධනය මන්දගාමී වීම රජයේ ආදායම් අඩුවීමට හේතු විය හැකි වුවද වියදම් පාලනය සහ ආදායම් වර්ධනය කිරීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග තුළින් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 6.2 ක් ලෙස ඉලක්කගත අයවැය හිඟය පවත්වා ගැනීමට අපි කැපවී සිටින්නෙමු. මූලික වශයෙන්, විශේෂයෙන් එකතු කළ අගය මත බද්ද (VAT) සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධව ආදායම් පරිපාලනය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය අපි හඳුනාගෙන සිටින්නෙමු.

5. වැඩ සටහන යටතේ වන ඉලක්කයන් පිළිබඳව සලකා බැලීමේ දී, ශුද්ධ විදේශ සංචිතයන්හි ජූනි මස අග සඳහා වූ කාර්ය ඵල නිර්ණායකය සපුරාගන්නා ලදී. විනිමය අනුපාතයෙහි වෙනස්වීම් මත ශ්‍රී ලංකා මහ බැංකුවෙහි විදේශ වත්කම් කළඹෙහි තක්සේරු වටිනාකම් හි අහිතකර ලෙස ඇති වූ වෙනස්වීම් සහ තෙල් ආනයනයන් සඳහා වූ බිල්පත් ගෙවීම් ඇඩි ලෙස වර්ධනය වීම හමුවේ මෙම තත්ත්වය ළඟාකර ගන්නා ලදී. නවතම දත්තයන්ට අනුව, සංචිත මුදල් ඉලක්කය ද සපුරා ගැනීමට හැකිවනු ඇත. මන්දගාමී වර්ධනය සහ ඉහළ පොලී අනුපාතිකයන් රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය කෙරෙහි පීඩනයක් ඇති වී ඇති නමුත් පවතින දත්තයන්ට අනුව, රාජ්‍ය අයවැය හිඟයෙහි ශුද්ධ දේශීය මූල්‍යනය සඳහා ජූනි මස අග සඳහා වූ නිර්ණායකය ද සපුරා ගැනීමට අපට හැකිවනු ඇත. අප්‍රේල් මාසයේ දී ඛනිජ තෙල් පනත (ව්‍යුහාත්මක මිණුම් දඬු) සිදුකරන ලද සංශෝධනයන් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. වැඩසටහනෙහි ඉලක්කයන් සම්බන්ධයෙන් වූ ශක්තිමත් ක්‍රියාකාරිත්වය සහ නම්‍යශීලී සාර්ව ආර්ථික ප්‍රතිපත්ති කළමනාකරණය සඳහා වූ අඛණ්ඩ කැපවීම යටතේ සම්පස්ථ ණය පහසුකම සඳහා වූ අටවන සහ අවසාන සමාලෝචනය අවසන් කරන ලෙස අපි ඉල්ලා සිටින්නෙමු.

6. මෙම වැඩසටහනට සාර්ථක අවසානයකට ගෙන ඒම පිළිබඳව අපගේ දැඩි ප්‍රසාදය පළ කර සිටින්නෙමු. මෙම සමීපස්ථ ණය පහසුකම අපගේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට සහ එම ශක්තිය බාහිර ලෝකයට සන්නිවේදනය කර ගැනීමටත් උපකාරී විය. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති සමීප සබඳතාවය දිගටම පවත්වා ගැනීම බලාපොරොත්තු වන්නෙමු. නිශ්චිත වූ ආකෘති සැකසුම් මට්ටමේ පවතින නමුත්, අපේ ආර්ථික සංවර්ධන කටයුතු සඳහා මූල්‍යමය උපකාරයක් ලෙස විස්තීර්ණ ණය පහසුකමක් ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩලය සමග සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නෙමු. විචක්ෂණශීලී මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය තුළින් ආර්ථික වර්ධනය, සාර්ව ආර්ථික සහ මූල්‍ය ස්ථායීතාවය යනාදිය සඳහා ප්‍රමුඛත්වයක් ලබාදීමට මෙය අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇති අතර රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරිත්වය, ආදායම් පරිපාලනය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම ද කරනු ඇත.

7. මීට පෙර අභිප්‍රාය පළ කිරීමේ ලිපි මගින් මෙන්ම මෙම ලිපිය මගින් ද ඉදිරිය පිළිබඳව සකස්කොට ඇති ප්‍රතිපත්තීන්, අපගේ ආර්ථික වැඩ සටහනෙහි පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රමාණවත් බව අප විශ්වාස කරන නමුත්, මෙම පරමාර්ථ ඉටුකර ගැනීම තහවුරු කර ගැනීම සඳහා සුදුසු අතිරේක ක්‍රියාමාර්ග ගැනීමට ද අපි බලාපොරොත්තු වන්නෙමු. අප විසින් මෙම ලිපියෙහි අන්තර්ගත වැඩ පිළිවෙළ වෙනස් කිරීමක් හෝ වැඩසටහනෙහි පරමාර්ථයන්ගෙන් වෙනස්වන කිසියම් නව ක්‍රියාමාර්ගයක් ගැනීමට සිදුවුවහොත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සම්බන්ධීකරණය යටතේ එය සිදුකිරීමට සහ වැඩසටහන නිරීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ලබා දීමට කටයුතු කරන්නෙමු.

8. පාරදෘශ්‍යතාවය පිළිබඳ ප්‍රතිපත්තිය සුරකිමින්, මෙම ලිපිය හා අමුණා ඇති තාක්ෂණික අවබෝධතා ගිවිසුම ප්‍රසිද්ධියට පත්කිරීමට රජය අවසර ලබා දී ඇත.

ඔබගේ අවංක,

.......................................... | ..........................................
---|---
ගීතාංජන ගුණවර්ධන | අජිත් නිවාඩ් කබ්රාල්
මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය | අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව

## 1 වන සටහන. ශ්‍රී ලංකාව : ප්‍රමාණාත්මක කාර්යඵල නිර්ණායකයන් (ප්‍ර.කා.නි.) සහ අනුමානගත ඉලක්කයන් (අ.ඉ.)

| | 2009 | 2010 | 2011 | 2012 | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මාර්තු අවසානයට අනුමානගත ඉලක්ක | | | ජූනි අවසානයට ශුද්ධ විදේශීය සංචිත මත කාර්යඵල නිර්ණායක සහ සංචිත මුදල් හා ශුද්ධ දේශීය මූල්‍යනය මත අනුමානගත ඉලක්ක | | |
| | | | | EBS/12/36 | ගලපන ලද | මූලික | EBS/12/36 | ගලපන ලද | මූලික |
| **ප්‍රමාණාත්මක කාර්යඵල නිර්ණායකයන් සහ අනුමානගත ඉලක්කයන්** | | | | | | | | | |
| • ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය සංචිත (අවම අගය, වසරේ මුල සිට සමුච්චිත අගයේ වෙනස්වීම එ.ජ.ඩොලර් මිලියනවලින්) 1/2/3/4/5/ | 2,725 | 921 | -1,061 | -684 | -415 | -251 | -670 | -574 | -324 |
| • ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත මුදල් (කාල පරිච්ඡේදය අවසානය වන විට උපරිම අගය රුපියල් මිලියනවලින්) | 303,500 | 358,869 | 442,436 | 468,500 | | 485,802 | 474,165 | | 462,319 |
| • බැංකු ක්‍රමයෙන් සහ බැංකු නොවන අංශයෙන් මධ්‍යම ආණ්ඩුව ලබා ගත් ශුද්ධ දේශීය මූල්‍යනය (උපරිම අගය, වසරේ මුල සිට සමුච්චිත අගය රුපියල් මිලියනවලින්) 6/7/8/9/10/ | 392,476 | 242,259 | 259,245 | 230,814 | | 248,992 | 300,478 | | 296,167 |
| **අඛණ්ඩ කාර්යඵල නිර්ණායකයන්** | | | | | | | | | |
| • අළුතින් එකතු වූ විදේශීය ගෙවීම් හිඟ මුදල් සමුච්චිත අගයක් ලෙස (කාල පරිච්ඡේදය අවසානයේ උපරිමය එ.ජ.ඩොලර් මිලියනවලින්) | 0 | 0 | 0 | 0 | | 0 | 0 | | 0 |
| **අනුමානගත ඉලක්කයන්** | | | | | | | | | |
| • ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා විදුලිබල මණ්ඩලයේ සමස්ථ ශේෂය (අවම අගය, වසර මුල සිට සමුච්චිත අගයක් ලෙස රුපියල් මිලියනවලින්) 11/ | -19,400 | -22,900 | -113,800 | | | | | | |
| **විශේෂිත අයිතමයන්** | | | | | | | | | |
| • වැඩසටහන යටතේ අනුමාන කරන ලද විදේශීය ණය සේවාකරණ ගෙවීම් (වසර මුල සිට සමුච්චිත අගය රුපියල් මිලියනවලින්) 7/ | 141,914 | 108,607 | 132,411 | | | | | | |
| • මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යාපාරවල විකිණීම හේතුවෙන් මධ්‍යම ආණ්ඩුව වෙත ලැබෙන පෞද්ගලීකරණ ලැබීම් (රුපියල් මිලියනවලින්) 8/ | 0 | 0 | 0 | | | | | | |
| • ලංකා බැංකුව කෙරෙහි මධ්‍යම රජය සතු නොපියවූ වගකීම් (අයිතම viii (ඉ.1) ලංකා බැංකුවේ ශේෂ පත්‍රය අනුව, රුපියල් මිලියනවලින්) 9/ | 6,038 | 1,575 | 1,575 | | | | | | |
| • වැඩසටහන යටතේ අනුමාන කරන ලද විදේශීය වැඩසටහන් මූල්‍යනය (වසර මුල සිට සමුච්චිත අගයක් ලෙස එ.ජ.ඩොලර් මිලියනවලින්) | 0 | 40 | .... | .... | | .... | .... | | .... |
| • මෙම වැඩසටහන යටතේ අනුමාන කරන ලද (යූරෝ බැඳුම්කර සහ ජාත්‍යන්තර වෙළෙඳපොළෙන් ලබාගත් ඒකාබද්ධ ණය ඇතුළුව) විදේශීය වාණිජ ණය (වසර මුල සිට සමුච්චිත අගයක් ලෙස එ.ජ.ඩොලර් මිලියනවලින්) 2/ | 500 | 1,000 | 1,000 | 0 | | 0 | 0 | | 0 |
| • වැඩසටහන යටතේ අනුමාන කරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශිකයන් සතු ආයෝජන ප්‍රමාණයේ සමුච්චිත ශුද්ධ වෙනස්වීම (වසර මුල සිට සමුච්චිත අගයක් ලෙස එ.ජ.ඩොලර් මිලියනවලින්) 1/ | 1,345 | 467 | 232 | .... | | .... | .... | | .... |
| • වැඩසටහන යටතේ අනුමාන කරන ලද නිල විදේශීය ණය සේවාකරණ ගෙවීම් (වසර මුල සිට සමුච්චිත අගයක් ලෙස එ.ජ.ඩොලර් මිලියනවලින්) 3/ | 878 | 874 | 1,072 | .... | | .... | .... | | .... |
| • මෙම වැඩසටහන යටතේ අනුමාන කරන ලද ජාත්‍යන්තර වෙළෙඳපොළෙන් ලබාගත් ඒකාබද්ධ ණය පියවීම් (වසර මුල සිට සමුච්චිත අගයක් ලෙස එ.ජ.ඩොලර් මිලියනවලින්) 4/ | 225 | 25 | 0 | 0 | | 0 | 0 | | 0 |
| • ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය හුවමාරු ගිවිසුම් සහ ඉදිරි විනිමය ගිවිසුම්වල නොපියවූ අගයන් (උදා: ලැබිය යුතු) (කාල පරිච්ඡේදය අවසානයේ එ.ජ.ඩොලර් මිලියනවලින්) 5/ | 245 | 97 | 0 | 782 | | 1,052 | 782 | | 878 |

1/ වැඩසටහන යටතේ අනුමාන කරන ලද ප්‍රමාණයට වඩා, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශිකයන් සතු ආයෝජනයන්හි සමුච්චිත ශුද්ධ වෙනස්වීම එ.ජ.ඩොලර් මිලියනවලින් ඉහළ/පහළ අගයක් ගනහොත්, පරීක්ෂණ දිනයේ දී ශුද්ධ විදේශීය සංචිතවල අවම අගයට එම සමුච්චිත වෙනස්වීම අනුව ඉහළට/පහළට ගැලපුමක් සිදු කරනු ඇත. (2011 දෙසැම්බර්වලින් පසු නොසලකා හැර ඇත)

2/ වැඩසටහන යටතේ අනුමාන කරන ලද ප්‍රමාණයට වඩා (යූරෝ බැඳුම්කර සහ ජාත්‍යන්තර වෙළෙඳපොළෙන් ලබාගත් ඒකාබද්ධ ණය ඇතුළුව) වාණිජ ණය එ.ජ.ඩොලර්වලින් ඉහළ/පහළ අගයක් ගනහොත් පරීක්ෂණ දිනයේ දී ශුද්ධ විදේශීය සංචිතවල අවම අගයට එම සමුච්චිත වෙනස්වීම් අනුව ඉහළට/පහළට ගැලපීමක් සිදු කරනු ඇත.

3/ වැඩසටහන යටතේ අනුමාන කරන ලද ප්‍රමාණයට වඩා මධ්‍යම ආණ්ඩුවේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් එ.ජ.ඩොලර්වලින් ඉහළ/පහළ අගයක් ගනහොත්, පරීක්ෂණ දිනයේ දී ශුද්ධ විදේශීය සංචිතවල අවම අගයට එම සමුච්චිත වෙනස්වීම් අනුව පහළට/ඉහළට සිදු කරනු ඇත. (2011 දෙසැම්බර්වලින් පසු නොසලකා හැර ඇත)

4/ වැඩසටහන යටතේ අනුමාන කරන ලද ප්‍රමාණයට වඩා මධ්‍යම ආණ්ඩුව විසින් ඒකාබද්ධ ණය මත සිදු කරන ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණය එ.ජ.ඩොලර්වලින් ඉහළ/පහළ අගයක් ගනහොත්, පරීක්ෂණ දිනයේ දී ශුද්ධ විදේශීය සංචිතවල අවම අගයට එම සමුච්චිත වෙනස්වීම අනුව පහළට/ඉහළට ගැලපීමක් සිදු කරනු ඇත. 2009 දෙසැම්බර් අග සිට ගැලපුම හඳුන්වාදී ඇත.

5/ වැඩසටහනේ අර්ථ දක්වා ඇති විනිමය හුවමාරු ගිවිසුම් හා ඉදිරි විනිමය ගිවිසුම්වල නොපියවූ අගයන් (උදා: ලැබිය යුතු) ඉහළ/පහළ ගිය ප්‍රමාණයන්ගෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශ සංචිත ඉලක්කය ඉහළට/පහළට ගැලපීමක් සිදු කරනු ඇත. මෙම ගැලපීම 2012 මාර්තු අග හඳුන්වා දෙන ලදී. 2012 පෙබරවාරි මස 29 වැනි දින වනවිට මෙම ගිවිසුම් යටතේ නොපියවූ වටිනාකම එ.ජ.ඩොලර් මිලියන 782 ක් වේ. උපරිමය එ.ජ.ඩොලර් මිලියන 600 කට යටත්ව විනිමය හුවමාරු ගිවිසුම් හා ඉදිරි විනිමය ගිවිසුම්වල නොපියවූ අගය ඉහළ ගිය ප්‍රමාණයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශ සංචිත ඉලක්කය ඉහළට ගැලපීමක් සිදු කරනු ඇත.

6/ වැඩසටහන යටතේ අනුමාන කරන ලද ප්‍රමාණයට වඩා විදේශීය ණය රුපියල් වටිනාකම මත ගත් කළ ඉහළ/පහළ අගයක් ගනහොත්, මධ්‍යම ආණ්ඩුවේ ශුද්ධ දේශීය මූල්‍යනයන්ගේ සමුච්චිත උපරිම ප්‍රමාණය පරීක්ෂණ දිනයේ දී එම විදේශීය ණයවල සමුච්චිත වෙනස්වීම් අනුව පහළට/ඉහළට ගැලපීමක් සිදු කරනු ඇත. දෙසැම්බර් අග සිට, විදේශීය ණය නිර්වචනය කරනු ලබන්නේ විදේශීය වැඩ සටහන් ණය සහ විදේශීය වාණිජ ණය (යූරෝ බැඳුම්කර සහ ජාත්‍යන්තර වෙළෙඳපොළෙන් ලබාගත් ඒකාබද්ධ ණය ඇතුළුව) ලෙසය.

7/ වැඩසටහන යටතේ අනුමාන කරන ලද ප්‍රමාණයට වඩා මධ්‍යම ආණ්ඩුවේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් රුපියල්වලින් ගත් කළ ඉහළ/පහළ අගයක් ගනහොත්, මධ්‍යම ආණ්ඩුවේ ශුද්ධ දේශීය මූල්‍යනයන්ගේ සමුච්චිත උපරිම ප්‍රමාණය පරීක්ෂණ දිනයේ දී එම විදේශීය ණය සේවාකරණ ගෙවීම්වලට සමුච්චිත වෙනස්වීම් අනුව ඉහළට/පහළට ගැලපීමක් සිදු කරනු ඇත.

8/ වැඩසටහන යටතේ අනුමාන කරන ලද ප්‍රමාණයට වඩා මධ්‍යම ආණ්ඩුවේ වත්කම් විකිණීම් හේතුවෙන් මධ්‍යම ආණ්ඩුව වෙත ලැබෙන පෞද්ගලීකරණ ලැබීම් ඉහළ/පහළ අගයක් ගනහොත්, මධ්‍යම ආණ්ඩුවේ ශුද්ධ දේශීය මූල්‍යනයන්ගේ සමුච්චිත උපරිම ප්‍රමාණයට පරීක්ෂණ දිනයේ දී එම සමුච්චිත පෞද්ගලීකරණ ලැබීම්/ප්‍රතිපූරණය කිරීම අනුව පහළට/ඉහළට ගැලපීමක් සිදු කරනු ඇත.

9/ ලංකා බැංකුවේ ශේෂ පත්‍රයට අනුව, ලංකා බැංකුව කෙරෙහි මධ්‍යම රජය සතු නොපියවූ වගකීම්වල (අයිතම VIII (ඉ.1)) රුපියල් වටිනාකම වැඩසටහන යටතේ අනුමාන කරන ලද ප්‍රමාණයට වඩා පහළ අගයක් ගනහොත්, මධ්‍යම ආණ්ඩුවේ ශුද්ධ දේශීය මූල්‍යනයන්ගේ වෙතයට පරීක්ෂණ දිනයේ දී ඉහළට ගැලපීමක් සිදු කරනු ඇත.

10/ වැඩසටහන යටතේ අනුමාන කරන ලද ශුද්ධ දේශීය මූල්‍යනය තුළ රාජ්‍ය ආයතනවලින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලැබිය යුතු මුදල් පියවීම සඳහා නිකුත් කළ රුපියල් මිලියන 60,000 ක වටිනාකමින් යුතු ප්‍රතිව්‍යුහගත කිරීමේ බැඳුම්කරය ඇතුළත් වේ.

11/ 2010 දෙසැම්බර් අග සහ 2011 දෙසැම්බර් අග දත්ත සඳහා කරන ලද සුළු සංශෝධනයන්, විගණනය නොකරන ලද ප්‍රතිඵලයන් මත පදනම් වේ.

## 2 වන සටහන. ශ්‍රී ලංකාව : ව්‍යුහාත්මක මිණුම් දඬු (ව්‍යු.මි.ද)

| | ව්‍යුහාත්මක මිණුම් දඬු | දිනය | ක්‍රියාමාර්ගයෙහි ස්වභාවය |
|---|---|---|---|
| 1. | ප්‍රසිද්ධ කොටස් නිකුතුවක් තුළින් සෙලාන් බැංකුවේ ප්‍රාග්ධනය ප්‍රතිසම්පාදනය කිරීම. | 2009.09.30 | ක්‍රියාත්මක කර ඇත |
| 2. | ප්‍රශ්න මතුවී තිබෙන බැංකු සහ මූල්‍ය ආයතනයන්හි වැඩකටයුතු ක්‍රමවත් කිරීම සඳහා හදිසි ආපදා සැලසුමක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සකස් කිරීම. | 2009.09.30 | ක්‍රියාත්මක කර ඇත |
| 3. | පහත සඳහන් කරුණු අඩංගු වන පරිදි බැංකු පනත සහ අනෙකුත් අදාල නීති සහ ව්‍යවස්ථා සංශෝධනය කිරීම සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබාදීම.<br>i. සංරක්ෂකයාගේ සහ ඇවරකරුවාගේ කාර්ය සහ අත්පත් කරගැනීමේ විධිවිධාන වඩාත් පැහැදිලිව අර්ථ කථනය වන පරිදි බැංකු බේරුම් කිරීමේ රාමුව වැඩි දියුණු කිරීම.<br>ii. සියලුම ප්‍රධාන අවදානම් වඩාත් හොඳින් හඳුනා ගැනීමට හැකිවන පරිදි "විශාල නිරාවරණයන් සහ සම්බන්ධිත පාර්ශ්වයන්" (large exposures and related parties) යන නිර්වචනයන් වඩාත් ශක්තිමත් කිරීම. | 2009.09.30 | ක්‍රියාත්මක කර ඇත |
| 4. | 2010 අයවැය සඳහා ඇතුළත් කළ යුතු බදු පදනම් පුළුල් කිරීමේ නිර්දේශයන් ද ඇතුළත් අතුරු වාර්තාවක් බදු ප්‍රතිපත්ති සමාලෝචනය කිරීමේ කොමිෂන් සභාව විසින් භාර දීම. | 2009.10.15 | ප්‍රමාදයන් සහිතව ක්‍රියාත්මක කර ඇත |
| 5. | 2010 මුල් මාස 4 සඳහා ව්‍යාපෘති ඉලක්ක ඇතුළත් අතුරු අයවැයක් වෙනුවෙන් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීම. | 2009.12.15 | ක්‍රියාත්මක කර ඇත |
| 6. | ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, රාජ්‍ය බැංකුවලින් ලබාගත් නොගෙවූ ණය පියවීම සඳහා සැලසුමක් සකස් කිරීම. | 2009.12.31 | ක්‍රියාත්මක කර ඇත |
| 7. | ණය කාඩ්පත් සමාගම් සහ පියවීම් සේවාවන් සපයන සමාගම් සඳහා විචක්ෂණශීලී රෙගුලාසි සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම. | 2009.12.31 | ක්‍රියාත්මක කර ඇත |
| 8. | මෙම වැඩසටහනේ ඉලක්කවලට අනුරූප වන පරිදි 2010 අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | 2010.04.30 | ප්‍රමාදයන් සහිතව ක්‍රියාත්මක කර ඇත |
| 9. | සියලුම තැන්පතු බාරගන්නා මූල්‍ය සමාගම් සඳහා රෙගුලාසි පැනවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට ඇති නීතිමය බලය වඩාත් පැහැදිලි වන පරිදි මූල්‍ය සමාගම් පනත සංශෝධනය කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | 2010.05.31 | ප්‍රමාදයන් සහිතව ක්‍රියාත්මක කර ඇත |
| 10. | බදුකරණය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාව විසින් නිශ්චිත බදු ප්‍රතිව්‍යුහගත කිරීම් පිළිබඳ නිර්දේශයන් ඇතුළත් අවසන් වාර්තාවක් ඉදිරිපත් කිරීම. | 2010.08.31 | ප්‍රමාදයන් සහිතව ක්‍රියාත්මක කර ඇත |
| 11. | ව්‍යාපෘති ඉලක්ක හා සමගාමී වන පරිදි 2010 වසරට අදාළ අයවැය ලේඛනය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීම. | 2010.08.31 | ක්‍රියාත්මක කර ඇත |
| 12. | තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා රෙගුලාසි නිකුත් කිරීම. | 2010.09.30 | ක්‍රියාත්මක කර ඇත |

| | ව්‍යුහාත්මක මිණුම් දඬු | දිනය | ක්‍රියාමාර්ගයෙහි ස්වභාවය |
|---|---|---|---|
| 13. | ආදායම් බදු සහ එකතු කළ අගය මත බදු ප්‍රතිව්‍යුහගත කිරීමේ නිර්දේශයන් ඇතුළත් ව්‍යාපෘති ඉලක්කයන්ගෙන් සමන්විත 2010 අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | 2010.11.30 | ක්‍රියාත්මක කර ඇත |
| 14. | පෞද්ගලික අංශය සඳහා විශ්‍රාමික අරමුදලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය රෙගුලාසි රාමුව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීම. | 2010.12.31 | ළඟාකර නොමැත |
| 15. | 2009 අවසානය දක්වා ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු වගකීම් ප්‍රතිව්‍යුහගත කිරීම. | 2010.12.31 | ප්‍රමාදයන් සහිතව ක්‍රියාත්මක කර ඇත |
| 16. | ආයෝජන මණ්ඩලයේ රෙගුලාසි සංශෝධනය කිරීම | 2011.03.31 | ක්‍රියාත්මක කර ඇත |
| 17. | උපායශීලී ආයෝජන නීතිය සංශෝධනය කිරීම සහ උපායශීලී ව්‍යාපෘති නිර්වචනය කිරීම සහ ගිවිස ගැනීම සඳහා උපකාරී වන රෙගුලාසි නිකුත් කිරීම | 2011.03.31 | ක්‍රියාත්මක කර ඇත |
| 18. | බැංකු පනතේ සංශෝධනයන් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම | 2011.03.31 | ප්‍රමාදයන් සහිතව ක්‍රියාත්මක කර ඇත |
| 19. | ඛනිජ තෙල් පනතේ සංශෝධනයන් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම | 2011.09.30 | ප්‍රමාදයන් සහිතව ක්‍රියාත්මක කර ඇත |
| 20. | 2012 වසරේ අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | 2011.11.30 | ක්‍රියාත්මක කර ඇත |

# තාක්ෂණික අවබෝධතා ගිවිසුම

1. සම්පස්ථ ණය පහසුකම් වැඩ සටහන යටතේ ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම සඳහා රාමුවක් මෙම තාක්ෂණික අවබෝධතා ගිවිසුම මගින් සකස් කරනු ලබයි. මෙම අවබෝධතා ගිවිසුම මගින්, කාර්යඵල නිර්ණායකයන් සහ අනුමානගත ඉලක්ක (ගැලපුම් ද ඇතුළත්) නියම කරන අතර, ඒ යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරීත්වය 2012 ජූලි මස 20 වන දිනට සිදු කිරීමට නියමිත අටවන සහ අවසාන සමාලෝචනයේ දී ඇගයීමට ලක් කෙරෙනු ඇත.

## I. රාජ්‍ය මූල්‍ය ඉලක්ක

### අ. මධ්‍යම රජයේ ශුද්ධ දේශීය මූල්‍යනය සම්බන්ධව අනුමානගත නිර්ණායකය

2. දේශීය බැංකු ක්‍රමය මගින් මධ්‍යම රජයට ලබාදෙන ශුද්ධ ණයවල ඇතිවන වෙනස්වීම සහ දේශීය බැංකු නොවන අංශය වෙතැති භාණ්ඩාගාර බිල්පත් සහ වෙනත් රජයේ සුරැකුම්පත්වල ඇතිවන ශුද්ධ වෙනස් වීම ශුද්ධ දේශීය මූල්‍යනය (ශු.දේ.මු.) ලෙස නිර්වචනය කරනු ලබයි. වැඩසටහන අධීක්ෂණය කිරීමේ අරමුණ සඳහා මධ්‍යම රජය ලෙස නිර්වචනය කරනු ලබන්නේ රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් රාජ්‍ය ආයතනයන්ය. ශ්‍රී ලංකා මහ බැංකුව, රජය සතු ව්‍යාපාර, රජයේ පාලනය යටතේ පවතින ව්‍යාපාර සහ වෙනත් නියෝජිත ආයතන වැනි මධ්‍යම රජයෙන් මූල්‍ය ආධාර නොලබන ආයතන මධ්‍යම රජය ලෙස නිර්වචනය කිරීමේ දී බැහැර කොට ඇත. මධ්‍යම රජයේ ශුද්ධ දේශීය මූල්‍යනය යන්න, (i) ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබාගන්නා ශුද්ධ ණය ගැනීම් (අත්තිකාරම්, ණය, භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ වෙනත් මධ්‍යම රජයේ බැඳුම්කර එකතුවෙන් තැන්පතු අඩුකර), (ii) දේශීය වාණිජ බැංකු සහ දේශීය බැංකු නොවන අංශය මගින් ලබාගත් ශුද්ධ ණය (ණය, අත්තිකාරම්, ප්‍රතිව්‍යුහගත බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් සහ මධ්‍යම රජයේ වෙනත් සුරැකුම්පත් එකතුවෙන් තැන්පතු අඩුකර), සහ විදේශීය ආයෝජකයින් සතු භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර යන අයිතමයන් සමන්විතව නිර්වචනය කොට ඇත. 2009 වසරේ දී මේ ආකාරයෙන් නිර්වචනය කළ මධ්‍යම රජයේ ශුද්ධ දේශීය මූල්‍යනය රුපියල් බිලියන 392.5 ක් විය. මෙම වටිනාකමින් රුපියල් බිලියන 49.0 ක් දේශීය බැංකු ක්‍රමයෙන් ලබාගත් ණය ද රුපියල් බිලියන 185.2 ක් දේශීය බැංකු නොවන අංශයෙන් ලබාගත් ශුද්ධ ණය වලින් ද, රුපියල් බිලියන 146.9 ක් භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර වෙළෙඳපොළට ලැබුණ ශුද්ධ විදේශීය ආයෝජනවලින් සහ රුපියල් බිලියන 11.3 ක් වෙනත් මූලාශ්‍රයන්ගෙන් ලබාගත් ශුද්ධ ණය ගැනීම්වලින් ද සමන්විත විය.

ආ. ලංකා විදුලිබල මණ්ඩලයේ හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත ශේෂයේ එකතුව මත වන අනුමානගත ඉලක්කය

3. මෙහෙයුම් ආදායම් ප්‍රකාශනයේ සඳහන්ව ඇති පරිදි ලංකා විදුලිබල මණ්ඩලයේ හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත ලාභ අලාභ ශේෂය උපචිත පදනම යටතේ ගණනය කර ඇත. 2009 දෙසැම්බර් අවසානය වන විට මේ ආකාරයෙන් ගණනය කර ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත අලාභය රුපියල් බිලියන 19.4ක් විය.

## II මුදල් ඉලක්ක

අ. ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත මුදල් සඳහා වන අනුමානගත නිර්ණායක

4. ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත මුදල්, බැංකු සහ මහජනයා සතු ව්‍යවහාර මුදල්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති මූල්‍ය ආයතන සතු දේශීය මුදල් තැන්පතු සහ ජාතික ආරක්ෂක අරමුදල (ගිණුම් අංක 4278), බුද්ධ ශාසන අරමුදල් ගිණුම (පොදු ලෙජර් ගිණුම් අංක 4279) සහ මංමාවත් නඩත්තු කිරීමේ භාරකාර අරමුදල (පොදු ලෙජර් ගිණුම් අංක 4281) යනාදී රාජ්‍ය නියෝජිත ආයතන සතු තැන්පතුවලින් සමන්විත වේ. මේ ආකාරයෙන් නිර්වචනය කළ සංචිත මුදල් 2009 දෙසැම්බර් මස අවසානය වනවිට රුපියල් බිලියන 303.5 ක් විය. මෙම වැඩසටහන නියාමනය කිරීමේ අරමුණට අනුව අදාළ දිනයට සංචිත මුදල් ගණනය කිරීමේ දී සංචිත සතිය තුළ (සිකුරාදා සිට බ්‍රහස්පතින්දා දක්වා) පැවති සාමාන්‍ය සංචිත මුදල් ප්‍රමාණය සැළකිල්ලට ගනු ඇත.

## III. විදේශීය අංශයේ ඉලක්ක

අ. ශුද්ධ නිල විදේශීය සංචිත සඳහා වූ කාර්යසාධන නිර්ණායකය

5. ශුද්ධ නිල විදේශීය වත්කම් ලෙස නිර්වචනය කරනු ලබන්නේ වෙළෙඳපොළ අගයයන්ගෙන් ප්‍රකාශයට පත් කරනු ලබන (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ දළ විදේශීය වත්කම් හා වගකීම් අතර වෙනස සහ (ii) රජයේ මහා භාණ්ඩාගාරයේ (DSTs) ඇති ඩොලර් සහ යෙන්වලින් ප්‍රකාශිත විශේෂ චක්‍රීය ගිණුම්වල ශේෂයන්ය. ශ්‍රී ලංකා මහ බැංකුවේ දළ විදේශීය වත්කම් සමන්විත වන්නේ, මූල්‍යමය රන්, ශ්‍රී ලංකාවෙන් පිටත පවතින විදේශ විනිමය ශේෂයන්, විදේශීය සුරැකුම්පත් (වෙළෙඳපොළ මිළ ගණන් අනුව තක්සේරු කරන ලද), මිලදී ගත් සහ වට්ටම් කරන ලද විදේශීය බිල්පත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ඇති සංචිත සහ විශේෂ ගැනුම් හිමිකම් සහ ක්‍රවුන් ඒජන්සි ආයතනයෙහි ඇති බැර ශේෂය යනාදියෙනි. ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල සහභාගීත්වය, ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පවතින වෙනත් මුදල්වලට ක්ෂණිකව පරිවර්තනය කළ නොහැකි මුදල්, මූල්‍යමය රන්වලට අමතරව පවතින වටිනා

ලෝහ වර්ග, නේවාසිකයන්ගේ හිමිකම්, (උදා: වාණිජ බැංකු සතු විදේශ විනිමය තැන්පතුවලින් පවතින ව්‍යවස්ථාපිත සංචිත සහ නේවාසික වාණිජ බැංකු සතු ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමයවලින් පවතින සංචිත) උකස් කරන ලද ද්‍රවශීල නොවන, ඇප මත හෝ එසේත් නැත්නම් ණයකට යටත් වූ විදේශ වත්කම් (2001/02 වසර තුළ ලොයිඩ්ස් ආයතනය සතුව පැවතුණු රජයෙහි යුධ අවදානම් රක්ෂණ තැන්පතුව වැනි) සහ ව්‍යුත්පන්න ගනුදෙනු තුළින් පැන නැගුණ විදේශ විනිමය හිමිකම් (අනාගත ගිවිසුම්, ඉදිරි ගනුදෙනු, ද්විපාර්ශ්වික විනිමය හුවමාරු සහ වරණයන්) යනාදිය දළ විදේශීය වත්කම්වලින් බැහැර කරනු ලැබේ. දළ විදේශීය වගකීම් යනු ශ්‍රී ලංකා මහ බැංකුව සතු අනේවාසිකයන් සඳහා වූ විදේශ ව්‍යවහාර මුදලින් වූ සියලුම වගකීම්, අරමුදලෙහි ණය භාවිතය, ආසියානු නිෂ්කාශන සංගමය වෙත කළයුතු ගෙවීම් සහ අනාගත ගිවිසුම්, ඉදිරි ගනුදෙනු, ද්විපාර්ශ්වීය විනිමය හුවමාරු සහ වරණයන් වැනි ව්‍යුත්පන්න ගනුදෙනු හේතුවෙන් ඇතිවන වගකීම් පියවීම සඳහා විදේශ විනිමය විකිණීම් සඳහා වන බැඳීම් වේ. මීට අමතරව, ශුද්ධ නිල විදේශීය වත්කම් සඳහා රජයේ මහා භාණ්ඩාගාරයේ එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩොලර්) සහ යෙන්වලින් ප්‍රකාශිත විශේෂ චක්‍රීය ගිණුම්වල ශේෂ ඇතුළත් වේ. මහා භාණ්ඩාගාරයේ ගිණුම් යනු රජයේ නියෝජිතයෙකු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන භාණ්ඩාගාරයට අයත් විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම් වේ. 2009 දෙසැම්බර් මස අවසානය වනවිට මේ ආකාරයෙන් නිර්වචනය කරන ලද නිල විදේශ සංචිතවල අගය එ.ජ.ඩොලර් මිලියන 4,150 ක් විය.

**මේ යටතේ පහත දැක්වෙන ගැලපුම් අදාළ වේ.**

6. 4 වන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති ආකාරයට යූරෝ බැඳුම්කර සහ බැංකු කිහිපයක සහභාගීත්වයෙන් ලබාදෙන ණය ඇතුළුව එ.ජ.ඩොලර්වල වටිනාකමින් යුත් වාණිජමය ණය ලබාගැනීම්, වැඩසටහන යටතේ උපකල්පනය කරන ලද අගයන්ට වඩා වැඩි/අඩු වුවහොත් ශුද්ධ විදේශීය නිළ සංචිතයේ පහළ සීමාව, පරීක්ෂා කරනු ලබන දිනට පැවති සමුච්චිත වෙනස මගින් ඉහළට/පහළට ගලපනු ලැබේ.

7. ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ විනිමය හුවමාරු ගිවිසුම් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති ශේෂයෙහි ශුද්ධ තත්ත්වයෙහි සිදුවූ වෙනස්කම් පෙන්නුම් කිරීමට, ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශ සංචිත සඳහා ගැලපුමක් යොදනු ලැබේ. විශේෂයෙන්ම, වැඩසටහන යටතේ පිළිගත් අගයන්ට (4 වන සංඛ්‍යා සටහන) වඩා විනිමය හුවමාරු ගිවිසුම් සහ ඉදිරි විනිමය ගනුදෙනුවල නොපියවා ඇති වටිනාකම වැඩි/අඩු නම්, වැඩසටහන යටතේ දක්වා ඇති අගයන්ට සාපේක්ෂව විනිමය හුවමාරු ගිවිසුම් සහ ඉදිරි විනිමය ගනුදෙනුවල නොපියවා ඇති වටිනාකමෙහි ඇති වෙනස මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශ සංචිත ඉලක්කය පහළට/ඉහළට ගලපනු ඇත. විනිමය හුවමාරු ගිවිසුම් සහ ඉදිරි විනිමය ගනුදෙනු මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට අයවිය

යුතු වටිනාකම, 2012 පෙබරවාරි මස වන විට එ.ජ.ඩොලර් මිලියන 782 ක් විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශ සංචිත ඉලක්කය මත පහළට කරනු ලබන ගැලපුම, එ.ජ.ඩොලර් මිලියන 600 ක උපරිමයක් දක්වා වේ.

8. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අරමුදල) විසින් ශ්‍රී ලංකාවට වෙන්කර ඇති විශේෂ ගැණුම් හිමිකමෙහි (වි.ගැ.හි.) ඕනෑම වැඩිවීමක දී ශුද්ධ විදේශීය නිල සංචිතයන්හි පහළ සීමාව ඉහළට ගලපනු ඇත. මෙම ණය පහසුකම අනුමත කරන අවස්ථාව වනවිට, ජා.මූ.අරමුදල විසින් ශ්‍රී ලංකාවට වෙන්කර ඇති වි.ගැ.හි. වටිනාකම, වි.ගැ.හි. මිලියන 70.868 කි.

### ආ. විදේශීය ගෙවුම් හිඟතාව පිළිබඳ කාර්ය සාධන නිර්ණායකය

9. **ශ්‍රී ලංකා මහ බැංකුව හෝ මධ්‍යම රජය (2 වන ඡේදයෙහි අර්ථ දක්වා ඇති පරිදි) මගින් සහතික වූ හෝ ගිවිසුම්වලට එළඹුනු විදේශීය ණය මත විදේශීය ගෙවුම් සම්බන්ධ ආපසු නොගෙවීම් ඇති නොවන ලෙස නිරන්තර කාර්ය සාධන නිර්ණායකයන් යොදා ගැනේ.** විදේශීය ගෙවුම් හිඟ මුදල් යනුවෙන් අදහස් කරනුයේ, 9 වන ඡේදයෙහි දක්වා ඇති පරිදි, විදේශීය ණය සේවා වගකීම් (මුල් මුදල හා පොලී), ගිවිසුමේ දැක්වෙන ලෙස නැවත ගෙවිය යුතු අවස්ථාවේ නොගෙවීම වේ. කෙසේ වුවද, වැඩසටහන නියාමනය කිරීමේ කර්තව්‍යයේ දී කල් ඉක්ම වූ ණය හා විවාදයට ලක් වූ ණය සේවාකරණ බැඳීම් බාහිර ගෙවුම් හිඟ මුදල් ලෙස නොසැලකේ.

## IV. දත්ත වාර්තාකරණ අවශ්‍යතාවයන්

10. ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සන්දේශයේ දක්වා ඇති අරමුණු හා ප්‍රතිපත්ති ළඟා කරගෙන තිබීම පිළිබඳව ජා.මූ.අරමුදලෙන් ඉල්ලා සිටින තොරතුරු ශ්‍රී ලංකාව විසින් ජා.මූ.අරමුදල වෙත, නිශ්චිත කාල ප්‍රාන්තර හෝ දිනවලට ලබා දිය යුතුය. සියලුම වැඩසටහන් අධීක්ෂණ දත්ත සැපයීම මුදල් අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සිදුකරනු ඇත. විදේශීය හා මූල්‍යමය ඉලක්ක පිළිබඳ දත්ත මසක් අවසන් වී සති 3 කට නොවැඩි කාලයක් ඇතුළත දී සපයනු ඇත.[1] රාජ්‍ය මූල්‍ය ඉලක්ක පිළිබඳ දත්ත, මසක් අවසන් වී සති 5 කට නොවැඩි කාලයක් ඇතුලත දී 5 වන සංඛ්‍යා සටහන ද, සෑම මසක් අවසන් වී සති 9 කට නොවැඩි කාලයක් ඇතුලත 6 වන සංඛ්‍යා සටහන ද සපයනු ලැබේ. ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අදාළ සමස්ත ශේෂය පිළිබඳ ඇස්තමේන්තු සති 4 ක් ඇතුළත ලබාදෙනු ඇත.

---

1/ වසර අවසානයේ ගිණුම් අවසන් කිරීමට අතිරේක කාලයක් අවශ්‍ය බැවින් 2010 සහ 2011 දෙසැම්බර් මස අවසානයට අදාළ මූල්‍ය සහ විදේශීය අංශයේ දත්ත ඉදිරිපත් කිරීමේ කාලය සති 5 ක් දක්වා දීර්ඝ කර ඇත.

11. වැඩසටහන යටතේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීමේ අරමුණ සඳහා 5 වන හා 6 වන සංඛ්‍යා සටහන්වල දක්වා ඇති ආකෘතියට අනුව දත්ත සපයනු ඇත.

12. වැඩසටහන යටතේ මූල්‍ය ඉලක්ක අධීක්ෂණය කිරීමෙහි අරමුණ සඳහා 7 වන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති ආකෘතියට අනුව දත්ත සපයනු ඇත.

13. වැඩසටහන යටතේ විදේශීය අංශයෙහි ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීමෙහි අරමුණ සඳහා 8 වන සහ 9 වන සංඛ්‍යා සටහන්වල දක්වා ඇති ආකෘතියට අනුව දත්ත සපයනු ඇත.

**1 වන සංඛ්‍යා සටහන. ශ්‍රී ලංකාව : විදේශීය වශයෙන් මූල්‍යනය කිරීමේ දී පදනම් වූ උපකල්පනයන්**

**(වසර මුල සිට සමුච්චිත වටිනාකම, ශ්‍රී ලංකා රුපියල් මිලියනවලින්)**

| | 2010 | 2011 | | | 2012 | |
|---|---|---|---|---|---|---|
| | දෙසැම්බර් | මාර්තු | ජූනි | දෙසැම්බර් | මාර්තු | ජූනි |
| විදේශීය ව්‍යාපෘති ණය | 5,699 | - | - | - | ...... | ...... |
| විදේශීය වාණිජ ණය | 0 | 0 | 0 | 0 | ...... | ...... |
| විදේශීය ණය සේවාකරණය | 96,555 | 31,221 | 57,915 | 116,466 | ...... | ...... |

**2 වන සංඛ්‍යා සටහන. ශ්‍රී ලංකාව : පෞද්ගලීකරණ ලැබීම් පිළිබඳ උපකල්පනයන්**

**(වසර මුල සිට සමුච්චිත අගයන් ශ්‍රී ලංකා රුපියල් මිලියනවලින්)**

| | 2010 | 2011 | | | 2012 | |
|---|---|---|---|---|---|---|
| | දෙසැම්බර් | මාර්තු | ජූනි | දෙසැම්බර් | මාර්තු | ජූනි |
| පෞද්ගලීකරණ ලැබීම් | 0 | 0 | 0 | 0 | ...... | ...... |

**3 වන සංඛ්‍යා සටහන. ශ්‍රී ලංකාව : මධ්‍යම රජයෙන් ලංකා බැංකුව වෙත ලැබිය යුතු ණය මුදල**

**(ලංකා බැංකු ශේෂ පත්‍රයෙහි අයිතම (VIII ) ( e,1) න් දැක්වෙන පරිදි වටිනාකම රුපියල් මිලියනවලින්)**

| | 2010 | 2011 | | | 2012 | |
|---|---|---|---|---|---|---|
| | දෙසැම්බර් | මාර්තු | ජූනි | දෙසැම්බර් | මාර්තු | ජූනි |
| ආනයන බිල්පත් සඳහා අයවිය යුතු මුදල් | 6,038 | 1,575 | 1,575 | 1,575 | ...... | ...... |

**4 වන සංඛ්‍යා සටහන. ශ්‍රී ලංකාව : ශුද්ධ විදේශ සංචිත සඳහා භාවිතා කළහැකි විදේශීය මූල්‍යනයන්**

**(වෙනත් ආකාරයෙන් සඳහන් නොවේ නම්, වසර මුල සිට සමුච්චිත අගයන් එ.ජ.ඩොලර් මිලියනවලිනි)**

| | 2010 | 2011 | | | 2012 | |
|---|---|---|---|---|---|---|
| | දෙසැම්බර් | මාර්තු | ජූනි | දෙසැම්බර් | මාර්තු | ජූනි |
| ව්‍යාපෘති ණය | 50 | - | - | - | ...... | ...... |
| විදේශීය වාණිජ ණය | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර | 0 | 0 | 0 | 0 | ...... | ...... |
| නිල විදේශීය ණය සේවාකරණ ගෙවීම් | 824 | 250 | 531 | 1,070 | ...... | ...... |
| විදේශීය බැංකු කිහිපයක සහභාගීත්වයෙන් ලබාගත් ණය පියවීම් | 25 | 0 | 0 | 0 | ...... | ...... |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය හුවමාරු ගිවිසුම් සහ ඉදිරි විනිමය ගනුදෙනු මත ලැබිය යුතු මුදල් 1/ | 200 | 0 | 0 | 0 | 782 | 782 |

1/ කාලපරිච්ඡේදය අවසානයේ දී ඇති තොගය

| 5 වන සංඛ්‍යා සටහන. ශ්‍රී ලංකාව: මධ්‍යම රජයේ රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය 1/ (රුපියල් මිලියනවලින්) |
|---|
| සමස්ත ආදායම |
| *බදු ආදායම* |
| ආදායම් බදු |
| එකතු කළ අගය මත බදු |
| දේශීය |
| ආනයන |
| නිෂ්පාදන බදු |
| සුරා බදු |
| දුම්වැටි/දුම්කොළ මත බදු |
| ඛනිජ තෙල් |
| රථවාහන |
| අනෙකුත් |
| මුද්දර බදු |
| වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද |
| හර බද්ද |
| ආනයන බදු |
| සෙස් බද්ද |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද |
| ජාතිය ගොඩනැඟීමේ බද්ද |
| දුරකථන ග්‍රාහක බද්ද |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් බදු |
| *බදු නොවන ආදායම* |
| *ප්‍රදාන* |
| සමස්ත වියදම් හා ශුද්ධ ණය දීම් |
| එයින්: පොලී ගෙවීම් |
| විදේශීය |
| වාණිජ |
| දේශීය |
| මධ්‍යම රජයේ සමස්ත අයවැය ශේෂය |
| මූල්‍යනය |
| ශුද්ධ දේශීය මූල්‍යනය |
| ශුද්ධ විදේශීය මූල්‍යනය |
| එයින්: වැඩසටහන් ණය |
| එයින්: ව්‍යාපෘති ණය |
| එයින්: වාණිජ ණය |
| එයින්: ණය ආපසු ගෙවීම් |
| පෞද්ගලීකරණ ලැබීම් |

1/ වැඩසටහනේ අධීක්ෂණ කටයුත්ත සඳහා එකඟ වූ පරිදි

6 වන සංඛ්‍යා සටහන. ශ්‍රී ලංකාව: මධ්‍යම රජයේ වියදම්1/
(රුපියල් මිලියනවලින්)

**සමස්ත වියදම් හා ශුද්ධ ණය දීම්**

*වර්තන වියදම්*

රාජ්‍ය සේවක වැටුප් සහ වේතන

අනෙකුත් සිවිල් අංශයේ භාණ්ඩ හා සේවා

ආරක්ෂක වියදම්

පැවරුම් සහ සහනාධාර

කුටුම්බ

එයින් : සමෘද්ධි

විශ්‍රාම වැටුප්

පොහොර

ආයතන, සංස්ථා සහ අනෙකුත් රාජ්‍ය ආයතන

පොලී ගෙවීම්

විදේශීය

වාණිජ

දේශීය

*ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්*

1/ වැඩසටහනේ අධීක්ෂණ කටයුත්ත සඳහා එකඟ වූ පරිදි

7 වන සංඛ්‍යා සටහන. ශ්‍රී ලංකා මහ බැංකුවේ ශේෂ පත්‍රය 1/
(රුපියල් මිලියනවලින්)

ශුද්ධ විදේශීය වත්කම්

*විදේශ වත්කම්*

විදේශයන්හි ඇති මුදල් හා ශේෂයන්

විදේශ සුරැකුම්පත්

ආසියානු නිෂ්කාශන සංගමයෙන් ලැබිය යුතු මුදල්

විශේෂ ගැණුම් හිමිකම්

ජා.මූ.අ. සම්බන්ධ වත්කම්

ලැබිය යුතු මුදල්

විදේශීය මුදලින් නාමනය කර ඇති සංචිත

*විදේශීය වගකීම්*

ජා.මූ.අ. සහ අනේවාසික ගිණුම

ආසියානු නිෂ්කාශන සංගමයට ගෙවිය යුතු මුදල්

ශුද්ධ දේශීය වත්කම්

*රජයට දෙන ලද ණය*

අත්තිකාරම්

භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර

එකතුවෙමින් පවතින මුදල් අයිතමයන්

*රජයේ තැන්පතු*

*වාණිජ බැංකුවලට දෙන ලද ණය*

මධ්‍යකාලීන සහ දිගුකාලීන

කෙටිකාලීන

*අනෙකුත් අයිතමයන්හි එකතුව (ශුද්ධ)*

සංචිත මුදල්

ව්‍යවහාර මුදල්

වාණිජ බැංකු තැන්පතු

රාජ්‍ය නියෝජ්‍ය ආයතනවල තැන්පතු

1/ වැඩසටහනේ අධීක්ෂණ කටයුත්ත සඳහා එකඟ වූ පරිදි

8 වන සංඛ්‍යා සටහන. ශ්‍රී ලංකාව : මහ බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම් පිළිබඳ සාරාංශය 1/
(එ.ජ.ඩොලර් මිලියනවලින්)

1. මුළු ලැබීම්
   ණය
      වැඩසටහන් ණය
      ජා.මූ.අ.
      ව්‍යාපෘතිමය ණය (මුදලින් ලද කොටස පමණි)
   පොලී ලැබීම්, විදේශ විනිමය වෙළෙඳාමෙන් ඉපැයූ ලාභ, ප්‍රාග්ධන ලාභ
   විදේශ විනිමය මිලදී ගැනීම්
   මහා භාණ්ඩාගාරයට (DST's) අයත් ගිණුම්වල ශේෂයන්හි වෙනස්වීම
   අනෙකුත් ලැබීම්
      ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින් ලද ණය
      විදේශ මුදල් බැංකු ඒකකවලින් ලද ණය
      ඒකාබද්ධ ණය
      වාණිජමය ණය
   ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ විදේශ විනිමය තැන්පතු ආපසු ලබා ගැනීම්

2. මුළු ගෙවීම්
   රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම්
      ණය ආපසු ගෙවීම්
         මූලික (විදේශ ණය)
         ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පියවීම
         විදේශ මුදල් බැංකු ඒකකවලින් ලද ණය පියවීම
         ඒකාබද්ධ ණය පියවීම
      පොලී
         විදේශ ණය
         දේශීයව ලද විදේශ ව්‍යවහාර මුදලින් ණය
   ජා.මූ.අරමුදලට කරන ලද ගෙවීම්/වගකීම්වල වටිනාකමේ සිදුවූ වෙනස්වීම්
   වාණිජ බැංකුවලට විදේශ විනිමය විකුණුම්
   ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ ඇති විදේශ විනිමය තැන්පතු

3. පවත්නා අනුපාතයන් යටතේ ශුද්ධ ලැබීම් (1-2)

ශුද්ධ විදේශ සංචිත
දළ විදේශ සංචිත

භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර වෙළෙඳපොළ තුළට ලද සමුච්චිත ශුද්ධ ලැබීම්

1/ වැඩසටහනේ අධීක්ෂණ කටයුත්ත සඳහා එකඟ වූ පරිදි

## 9 වන සංඛ්‍යා සටහන. ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත දළ නිල සංචිත මට්ටම (එ.ජ.ඩොලර් මිලියනවලින්) 1/

| දිනය | මහ බැංකුව | | | | රජය | | | | මුළු දළ නිල සංචිත | | වගකීම් | | | | | ශුද්ධ විදේශීය සංචිත | සමස්ත ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් කළමනාකරණය වන සංචිත | | ජා.මූ. අරමුදලේ ඇති සංචිත ප්‍රමාණය සහ වි.ගැ.හි භාරය 3 | මුළු (2)+(3) 4 | කුවුන් ඒජන්ට්ස් බැංකුවේ ඇති රන් පවුම් ශේෂය 5 | මහා භාණ්ඩාරයට අයත් එ.ජ. ඩොලර් ගිණුම් 6 | මහා භාණ්ඩාගාරයට අයත් යෙන් ගිණුම් 7 | මුළු (5)+(6)+(7) 8 | (ආ.නි.ස. ලැබීම් රහිත) (1) + (3) +(8) 9 | (ආ.නි.ස. ලැබීම් සහිත) (4) + (8) 10 | අනෙකුත් තැන්පතු | ආසියානු නිෂ්කාශන සංගමය (ආ.නි.ස.) | ජා.මූ. අරමුදලින් ලද ණය | විනිමය හුවමාරු ගිවිසුම් | මුළු | | |
| | (ආ.නි.ස. ලැබීම් රහිත) 1 | (ආ.නි.ස. ලැබීම් සහිත) 2 | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |

1/ වැඩසටහනේ අධීක්ෂණ කටයුත්ත සඳහා එකඟ වූ පරිදි